දොම්පෙ ප්‍රාදේශීය සභාව
ගම්පහ දිස්ත්‍රික්කය

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජූනි 30 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 28 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 සැප්තැම්බර් 30 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල නිදහස් කළ ස්ථාවර තැන්පතු 02 ට අදාලව ලද බැංකු පොලී ආදායම රු.7,827,367 ක් ගිණුම් ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | වරිපනම් සඳහා දුන් වට්ටම් රු.995,024 ක් වරිපනම් ගිණුමට හර කිරීම නිසා වරිපනම් ආදායම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | වැකේ උප කාර්යාලය හා දොම්පෙ උප කාර්යාලයට අනුබද්ධ පුස්තකාල සඳහා මිලදීගත් පොත් පිළිවෙලින් රු.55,225 ක් හා රු.37,725 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | සභාවේ ගොඩනැගිලි 09 ක එකතු වටිනාකම රු.4,364,334 ක් හා පරිත්‍යාග ලෙස ලද රු.43,691 ක් වටිනා ජල ටැංකි 2 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු දෙකක් නිදහස් කිරීමෙන් ලද මුදල වූ රු.75,402,367 ක් මූලධන ලැබීම් ලෙස ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | වෙළඳ ස්ථාන කුලීවලට අදාල අධි ගාස්තු රු.355,060 ක් අදාල ආදායම් ගිණුම් හර කර අධි ගාස්තු ගිණුම බැර කරනවා වෙනුවට අධිගාස්තු ගිණුම හර කර අදාල ආදායම් ගිණුම් බැරකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (උ) | සමුච්චිත අරමුදලට රු.180,528,213 ක් බැර කර තිබුණද , ඊට අදාල හර සටහන් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඌ) | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වර්ෂයේ වියදම් හා ආදායම් ගිණුම් අතර ඇතිවූ රු.65,195,450 ක වෙනස හඳුනානොගෙන සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (එ) | හඳුනාගත නොහැකි රු.851,358 ක ණයහිමි ශේෂයක් බැර සටහනක් නොමැතිව සමුච්චිත අරමුදලට හරකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඒ) | 2005 මාර්තු 08 මිලදීගෙන තිබූ රු.178,250 ක වටිනාකමැති කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය මෝටර් රථ හා කරත්ත ලෙස ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඔ) | රු.15,180,000 ක හඳුනා නොගත් ශේෂයක් ආදායම් වියදම් ගිණුමට හර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඕ) | ඉතිරි කිරීමේ ගිණුමෙන් ජංගම ගිණුමට වර්ෂය තුල මාරුකර තිබූ රු.20,000,000 ක් මූලධන ලැබීම් ගිණුමට බැර කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන ලැබීම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ක) | 2016 සිට 2019 වර්ෂය සඳහා මූලධන ආධාර ලෙස රු.87,263,622 ක් ලැබී තිබූ නමුත් එය රු.86,384,907 ක් ලෙස ගිණුම්ගතකිරීම නිසා රු.878,715 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඛ) | 2019 වර්ෂයට අදාල මූලධන ආධාර ආදායම් ලෙස රු.119,354,754 ක් ගිණුම්ගත කලයුතු වුවද, රු.127,151,366 ක් ලෙස ගිණුම්ගතකර තිබීම නිසා රු.7,796,612 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ග) | සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා කර්මාන්ත සඳහා ලැබියයුතු සහ ගෙවියයුතු රු.8,136,746 ක් මූලධන ආධාර ගිණුමට සහ මූලධන වැය ගිණුමට ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ච) | අභ්‍යාසලාභී වැටුප් කපාහැරීම් රු.40,000 ක් කර්මාන්ත ණයගැති ගිණුමට බැර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ජ) | බැංකු පොලී සඳහා අයකරන ලද බදු වටිනාකම රු.237,562 ක් බැංකු පොලී ගිණුම මගින් ගැලපීම නිසා බැංකු පොලී ආදායම් රු.237,562 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ට) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ආපසු ගෙවිය යුතු තැන්පතු වටිනාකම රු.23,296,659 ක් වුවද ශේෂ පත්‍රයෙහි රු.26,075,249 ක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඩ) | සමාලෝචිත වර්ෂයේ ඉදිරියට ගෙවන ලද වරිපනම් රු.841,429 ක් වරිපනම් ගිණුමට ගැලපුම් කර නොතිබීම නිසා එම වටිනාකමින් හිඟ හිටි වරිපනම් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.2 නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 05 ක ශේෂ එකතුව රු.164,784,464 ක් වුවද, උපලේඛනය අනුව එම ශේෂයන්ගේ එකතු වටිනාකම රු.95,840,977 ක් වූයෙන් රු.68,943,487 ක වෙනසක් විය. | ලේඛන හා උප ලේඛන නිවැරදි කිරීමට කළයුතු වේ. | ජර්නල් සටහන් මගින් වෙනස නිවැරදි කරමි. |

1.3.3 **විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.515,216,985 ක් වූ ගිණුම් 08 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | පෙන්වා දී ඇති විගණන සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කළයුතු වේ. | මේ වන විට ලේඛන යාවත්කාලීන කරගෙන යනු ලැබේ. |

1.4 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (I) 371 (2) | 2008 වර්ෂයේ සිට පැවත එන රු.82,656 ක අත්තිකාරම් ශේෂයක් පියවීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | එම මුදල කපාහැරීම සඳහා පළාත් පාලන කොමසාරිස් ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. |
| (II) 571 | රු.21,058,466 ක් වූ වර්ෂ 02 ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ආදායමට බැර කිරිම සඳහා අදාල උප ලේඛණ සකස් කරමි. |

1.5 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වර්ෂ 2 ත් 3 ත් අතර රු.4,939,611ක ණයගැති ශේෂයක් හා වර්ෂ 1 ට අඩු රු.56,511,853 ක ණයගැති ශේෂයක් පැවතුණි. | අයවියයුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අයකරගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ණයහිමි ශේෂය තුල වර්ෂ 3-5 අතර රු.536,000 ක්, වර්ෂ 2-3 ත් අතර රු.8,744,121 ක් හා වර්ෂ 01 ට අඩු රු.73,546,782 ක් විය. | ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අයකරගැනීමට කටයුතු කරමි. |

## 2. **මූල්‍ය සමාලෝචනය**

### 2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,560,194 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 26,395,978 ක් විය.

### 2.2 **මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා අරමුදල් ප්‍රදේශයේ ජනතාවට උපරිම ප්‍රතිලාභ ලැබිය හැකි පරිදි සැලසුම් සහගතව වැය කිරීම සභාවේ අරමුණ වුවද, සභාව සතු මුදල් රුපියල් මිලියන 112.23 ක් ස්ථාවර තැන්පතු 06 ක ආයෝජනය කර තිබුණි. | සැලසුම් ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරිමට ඉදිරි වසරේ දී සැලසුම් කර ඇත. |

### 2.3 **ආදායම් පරිපාලනය**

#### 2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2019 වර්ෂය** | | | | **2018 වර්ෂය** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කල ආදායම** | **රැස්කල ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිගය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල්කල ආදායම** | **රැස්කල ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිගය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 17,681,781 | 18,628,628 | 15,504,855 | 3,661,059 | 14,191,940 | 19,427,587 | 16,317,043 | 3,110,544 |
| කුලී | 18,641,340 | 19,970,448 | 19,273,084 | 697,364 | 4,351,800 | 52,725,117 | 52,725,117 | - |
| බලපත්‍ර ගාස්තු | 4,873,041 | 5,692,833 | 5,692,833 | - | 22,554,540 | 20,501,387 | 20,185,266 | 316,121 |
| වෙනත් ආදායම් | 148,108,392 | - | 223,329,043 | - | - | - | - | - |
| | 189,304,554 | 44,291,909 | 263,799,815 | 4,358,423 | 41,098,280 | 92,654,091 | 89,227,426 | 3,426,665 |

### 2.3.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට පැවති වරිපනම් හිඟ ශේෂය තුළ වර්ෂ 10 ට වැඩි රු.141,659 ක්, වර්ෂ 5-10 ත් අතර රු.106,091 ක්, වර්ෂ 3-5 අතර රු.114,189 ක් හා වර්ෂ 2-3 ත් අතර රු.1,287,917 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනමින් පියවර ගතයුතු වේ. | හිඟ ආදායම් අය කිරීමේ ක්‍රමවේදය යටතේ වරිපනම් ජංගම සේවා හා දේපල තහනම් මගින් හිඟ ආදායම් අය කිරීමට කටයුතු කරන බව දන්වා සිටින අතරම මේ වන විට හිඟ මුදල් සඳහා අවසාන නිවේදන නිකුත් කර ඇත. |
| (ii) | **වරිපනම් තක්සේරු ප්‍රතිශෝධනය**<br>ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අංක 1493 හා 2017 අගෝස්තු 25 දිනැති ගැසට් පත්‍රයෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර තිබුණද 2019 වර්ෂය වන විටත් සභාව විසින් වරිපනම් අයකර තිබුණේ නේවාසික දේපල 7308 කින් ව්‍යාපාරික දේපල 2653 කින් සහ වෙනත් දේපල 768 කින් පමණි. | ගැසට්පත්‍රය ප්‍රකාරව අයවියයුතු ආදායම් අයකරගැනීමට කටයුතු කළයුතු වේ. | මහ සභාවේ අනුමැතිය ලද විගස වරිපනම් බදු පැනවීමේ කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (iii) | 2015 වර්ෂයේදී අවසන්වරට සිදුකල වරිපනම් බදු තක්සේරුව වැකේ උපකාර්යාලය සහ පූගොඩ උපකාර්යාලය එය ක්‍රියාත්මක කර තිබුණේ 2018 වර්ෂයේදී වන අතර දොම්පෙ උපකාර්යාලය සහ කැරගල උපකාර්යාලය ක්‍රියාත්මක කර තිබුණේ 2019 වර්ෂයේදීය. | නව බදු තක්සේරුව අනුව ආදායම් අයකිරීමට කඩිනමින් පියවර ගතයුතු වේ. | තක්සේරු දෙපාර්තුමේන්තුව විසින් අදාල තක්සේරුව ලබා දුන් විගස ඉදිරි වර්ෂයේ සිට නව තක්සේරුවට අනුව මුදල් අයකිරීමට කටයුතු කර ඇති බව දන්වා සිටිමි. |

### 2.3.3 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **සංචාරක වෙළඳාම සඳහා බලපත්‍ර**<br>2015 දෙසැම්බර් 28 දිනැති අංක 1947/6 දරන ගැසට් පත්‍රයේ පොදු සම්මත අතුරු ව්‍යවස්ථාව පදනම් කරගනිමින් සංචාරක වෙළඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව වැළඳගෙන තිබුනද ආදායම් උපයාගැනීමට කටයුතු කර නොතිබුණි. | ගැසට්පත්‍රය ප්‍රකාරව බලපත්‍රලාභීන් හඳුනාගෙන ආදායම් අයකිරීමට කටයුතු කළයුතු වේ. | මේ වන විට බලපත්‍රලාභීන් හඳුනාගෙන ලබාගැනීමට කටයුතු කර ඇත. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය සහ සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිලිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 18 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අදාල වන අතුරු ව්‍යවස්ථා පනවා ගතයුතු වේ. | කාරණා 18ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන ඇත. |

(ආ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 08 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වේ. | 2020 වර්ෂයේදි ආදායම් වෙනුවෙන් වාර්ෂික සැලැසුම් සකස්කර ඇත. |

(ඇ) **කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ඇස්තමේන්තු වටිනාකම රු.1,724,036 ක් වූ මොරහේන ප්‍රජාශාලාව සඳහා ලක්ෂ 100 ක් වැයකර තිබූ අතර තවදුරටත් ඉදිකරමින් පැවතුණි. | අදාල කර්මාන්ත නියමිත දිනට වැඩ අවසන් කිරීමට කටයුතු කළයුතු වේ. | දෙවන අදියරට අයත් වැසිකිළි පද්ධතිය පමණක් සකස් කිරීමට ඇත. |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 සැප්තැම්බර් 19 දිනැති අංක LGD/01/D/2019/05 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු ලිපිය ප්‍රකාරව 2019 වර්ෂයේ අයවිය යුතු දේපල ණය පොලී රු.278,766 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. | අයවියයුතු ණය පොළී අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී අයකිරීමට කටයුතු කරමි. |

3.3 **මානව සම්පත් කළමනාකරණය**

(අ) **සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වසර 15 ක සිට පවතින පුස්තකාලාධිපති තනතුරු 06 ක් හා ආදායම් පරීක්ෂක තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළයුතු වේ. | වසර 15 ක සිට පවතින පුස්තකාලාධිපති තනතුරු 06 ක් හා ආදායම් පරීක්ෂක තනතුරු 02 ක් ඇතුලුව පුරප්පාඩු 08 ක් ඇත. |
| (ii) | 2014 දෙසැම්බර් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 පරිදි ප්‍රාථමික ගණයේ 18 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදී තිබුණද කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කර අනුමත කාර්යය මණ්ඩලයට ඇතුලත් කරගෙන නොතිබුණි. | අදාල තනතුරු අනුමත කාර්යය මණ්ඩලයට ඇතුලත් කරගතයුතු වේ. | මෙම තනතුරු අනුමත කාර්ය මණ්ඩලයට බාහිරව පවති. |

3.4 **වත්කම් කළමනාකරණය**

3.4.1 **පවරා නොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මණ්ඩාවල කහටගහවත්ත පොදු සුසානභූමිය පුද්ගලයකු අල්ලාගෙන භුක්තිවිඳින අතර පූගොඩ උප කාර්යාලයට අයත් ප්‍රතාපකන්ද පොදු සුසානභූමි ඉඩම මැනුම්කර වෙන්කර දී තිබුණි. | ඉඩම් නිරවුල් කිරීමට කටයුතු කළයුතු වේ. | 2021 වර්ෂයේදී මැනුම් කටයුතු කර නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කැරගල සහ පූගොඩ උපකාර්යාලවලට අයත් සභාව සතු බවට ලේඛනවල පවතින පොදු ඉඩම් කැබලි වල ඔප්පු නොතිබුණි. | ඔප්පු ලබාගැනීමට කටයුතු කළයුතු වේ. | 2021 වර්ෂයේ ප්‍රකාශන ඔප්පු සකස් කිරීමට ඉදිරි කටයුතු කරමින් පවතී. |
| (ඇ) | දැනට භාවිතා නොකරන පොදු ළිං පිළිසකර කිරීම සහ නිශ්චිතව ස්ථාන සොයාගත නොහැකි පොදු ළිං සොයාගැනීමට කටයුතුකර නොමැති අතර සුසාන භූමි 46 ක් සඳහා පැවරුම් නියෝග ලබාගන්නා තුරු නඩත්තුකර නොතිබුණි. | සුසාන භූමි සඳහා පැවරුම් නියෝග ලබාගෙන නඩත්තු කටයුතු කළයුතු වේ. | එම ළිං සමීක්ෂණයෙන් හඳුනාගෙන මේ උපලේඛණ සකස්කර ඇත. |
| (ඈ) | 2012 වර්ෂයේ සහ 2015 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලද රු.11,178,226 ක් වටිනා වාහන 02 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරාගැනිම කඩිනමින් කළයුතු වේ. | පවරාගැනිමට අදාල මූලික ලියකියවිලි පළාත් පාලන කොමසාරිස් වෙතින්, මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුවට යවා ඇත. |
| (ඉ) | වටිනාකම රු.92,603,650 ක් වූ ඉඩම් 36 ක සහ වටිනාකම රු.608,315,000 ක් වූ සුසානභූමි 49 ක් සභාවට පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි. | පවරාගැනීමට අදාල කටයුතු කඩිනමින් කළයුතු වේ. | සුසාන භූමි 17 කින් 14 ක් සඳහා පැවරුම් නියෝග ලබා ගැනීම සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත අනුමැතිය ලැබුණු පසු ප්‍රාදේශීය ලේකම් වෙත යැවීමට ඉදිරි කටයුතු කර ඇත. |

### 3.4.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දොම්පෙ කොස්ගහ වත්ත ඉඩමේ ඉදිකර තිබූ කාය වර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල කැඩී අබලන්ව පැවතුණි. | ගොඩනැගිලි සංවර්ධනය කර ඵලදායී කාර්යයකට යෙදවිය යුතුවේ. | රජයේ නිලධාරින් සඳහා කාර්යාල පරිශ්‍රයක් ලෙස භාවිතා කිරිමට යෝජනා කර ඇත. |

### 3.4.3 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ වත්කම් සමීක්ෂණ වාර්තාවට අනුව වාහන 07 ක් භාවිතයට ගත නොහැකිව පැවතුණි. | අපහරණය කිරීම කඩිනමින් සිදු කළයුතු වේ. | වෙන්දේසි කර අපහරණය කිරීම සඳහා ඉදිරි කටයුතු කරගෙන යනු ලැබේ. |

3.5 **ප්‍රසම්පාදනය**

**--------------**

3.5.1 **සැපයීම් හා සේවා**

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඉදිරිපත් කළ අඩුම මිල වූ රු.418 බැගින් මිලදී ගන්නවා වෙනුවට වැඩි මිලක් වූ රු.488 බැගින් 23 W බල්බ 1500 ක් මිලදීගැනීම නිසා සභාවට රු.105,000 ක අලාභයක් සිදුවී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළයුතු වේ. | වර්ෂය මුලම මුළු තොගයම මිල ගණන් කැදවා ලබා ගැනීමෙන් කඩින් කඩ මිල වෙනස්වීම් වලට අනුව ලබාගැනිමෙන් තොරව වීජී පහන් ලබාගැනීමෙන් පාඩුවක් හෝ අලාභයක් සිදු නොවේ. |